# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/62 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40

**(188 වන අධිකාරය වූ). පුරාවස්තු ආඥාපනත**

19 වන වගන්තිය යටතේ වූ දැන්වීම

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්ය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පෞරාණික ස්මාරක, "ආරක්ෂිත ස්මාරක" බවට ප්‍රකාශයට පත්කරමින් එම ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2022.10.21 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය.

එවැනි සෑම විරෝධතාවක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, එම හේතු පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතු ය.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ස්මාරක***

1. උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙල්ලිපලෙයි (වලිකාමම් උතුර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ජේ/221, පත්තාවත්තෙයි ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පත්තාවත්තෙයි ග්‍රාමයට අයත් උතුරු අක්ෂාංශ $09^0$, 48', 00.931 හා නැගෙනහිර දේශාංශ $79^0$, 59', 45.388 ස්ථානයේ පිහිටි පත්තාවත්තෙයි ශාන්ත පිලිප් නේරිස් නමින් හඳුන්වන දේවස්ථානය.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 167 ඉපලෝගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉපලෝගම ග්‍රාමයට අයත් ඉපලෝගම බෝධිරුක්ඛාරාම විහාරයේ පිහිටි නව ටැම්පිට පිළිමගෙයි ඇති ගල්කණු, ටැම් ලිපිය, සිරිපතුල් ගල් ආදිය.

EOG 09 - 0361/1

---

එල්. ඩී. බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ). පුරාවස්තු ආඥාපනත**

19 වන වගන්තිය යටතේ වූ දැන්වීම

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්යය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පෞරාණික ස්මාරක, "ආරක්ෂිත ස්මාරක" ලෙස ප්‍රකාශයට පත්කරමින් එම ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය සිදු කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2022.10.21 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය.

එවැනි සෑම විරෝධතාවක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, ඒ විරෝධතාව ඉදිරිපත් කරන්නේ කුමන හේතු මත ද, යන්න පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතු ය.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ප්‍රකාශයට පත් කරනු ලබන ආරක්ෂිත ස්මාරක ලේඛනය***

**සබරගමුව පළාත**

01. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්වත්තහේන ග්‍රාම නිලධාරී වසමට අයත් පොල්වත්තහේන ග්‍රාමයේ පිහිටි කෙසෙල්වත්ත ශ්‍රී කදලිවනාරාම විහාර භූමියේ ඇති පැරණි විහාර මන්දිරය.

02. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 599, ඇම්පිටියගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් ඇම්පිටියගොඩ ග්‍රාමයේ පිහිටි වලව්වත්ත නමින් හඳුන්වන ස්ථානයේ ඇති ඇම්පිටියගොඩ වලව්ව.

03. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අංගම්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංගම්මන ග්‍රාම නිලධාරි වසමට අයත් අංගම්මන රජමහා විහාර භූමියේ ඇති මහනුවර යුගයේ සිතුවම්, මූර්ති හා කටාරම් සහිත ලෙන් විහාරය, දේවාල ගෘහ දෙක.

04. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 146 - බී බෝධිමළුව ග්‍රාම නිලධාරි වසමට අයත් නාමල්දෙණිය ග්‍රාමයේ, අංක 369 අවසන් ගම් සිතියමේ කැබලි අංක 150 වශයෙන් පෙන්නුම් කර ඇති හැරපොල මුකලාන (නාමල්දෙණිය). නමින් හඳුන්වන ඉඩමේ ඇති කටාරම් සහිත ලෙන සහ ලෙන පිහිටා ඇති ගල් පර්වතයේ පාමුල සිට මීටර් 5ක භූමි පරිශ්‍රය.

05. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 76, ගොඩපල ග්‍රාම නිලධාරි වසමට අයත් වට්ටාරම ග්‍රාමයේ පිහිටි ශ්‍රී අරහත්ත මලියදේව රජමහා විහාර පරිශ්‍රයේ ඇති පැරණි ශිලා කුළුණු සහිත නටඹුන් ස්ථාන හතර, ටැම්ලිපි හතර, පැරණි ගොඩනැගිලි පාදම සහ පැරණි පොත්ගුල.

06. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 116 - ඒ කුරුපැත්ත ග්‍රාම නිලධාරි වසමට අයත් නිකවලමුල්ල ග්‍රාමයේ පිහිටි මේනුගොල්ලවත්ත නමින් හඳුන්වන ඉඩමේ ඇති මැටි ඔරු සුසාන භූමිය.

07. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රංගේගම ග්‍රාම නිලධාරි වසමට අයත් රංගේගම ග්‍රාමයේ වුඩ්එන්ඩ් වතුයායේ යෝගම කොටසේ අංක 1988 කොටසේ ඇති කටාරම් කෙටූ ගල්ලෙන. (ලක්මන ගල්ලෙන).

08. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කප්පාගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් කප්පාගොඩ බ්‍රහ්මවර්ධනපාය රජමහා විහාර පරිශ්‍රයේ ඇති මලසුන්ගෙය.

09. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඟුරලකන්ද නැගෙනහිර අංක 120 ග්‍රාම නිළධාරි වසමට අයත් දික්ඇල්ල ග්‍රාමයේ පිහිටි බේලින්ගල *හෙවත්* හිඟුරලකන්ද නමින් හඳුන්වන ස්ථානයේ ඇති ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ගුහා ආවරණය. (උතුරු අක්ෂාංශ 06 x 91' 7360" N හා නැගෙනහිර දේශාංශ 80 x 30' 9614" E).

10. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඟුරලකන්ද නැගෙනහිර අංක 120 ග්‍රාම නිලධාරි වසමට අයත් දික්ඇල්ල ග්‍රාමයේ පිහිටි ගල්ගහහැත්ත නමින් හඳුන්වන ස්ථානයේ පිහිටා ඇති මහ ලෙනගල ලෙන ඇතුළත් අනෙකුත් ස්වාභාවික ගුහා ආවරණ (උතුරු අක්ෂාංශ 06 x 55' 242" N හා නැගෙනහිර දේශාංශ 80 x 18088" E).

11. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඟුරලකන්ද බටහිර අංක 120 - ඒ ග්‍රාම නිලධාරි වසමට අයත් දංගම්පල ග්‍රාමයේ පිහිටි හෙට්ටිකන්ද නමින් හඳුන්වන ස්ථානයේ ඇති ප්‍රාග් ඓතිහාසික සාධක සහිත බඹරගල ලෙන (උතුරු අක්ෂාංශ 06 x 922789" N හා නැගෙනහිර දේශාංශ 80 x 28' 6179" E).

12. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කප්පාගොඩ අංක 18 ඒ ග්‍රාම නිලධාරි වසමට අයත් පදීදොර ග්‍රාමයේ පිහිටි සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබා විහාර පරිශ්‍රයේ ඇති කටාරම් කෙටූ ලෙන, චෛත්‍ය, පිහිටි ගලේ කපා ඇති කාණුව හා පියගැට පෙළ, පැරණි සංඝාවාස ගෘහය (උතුරු අක්ෂාංශ 7' 1356" N හා නැගෙනහිර දේශාංශ 80 x 2620 E).

13. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අළුත්නුවර අංක 27 ග්‍රාම නිලධාරි වසමට අයත් අළුත්නුවර ග්‍රාමයේ පිහිටි ගල්ගේ ලෙන් විහාර පරිශ්‍රයේ ඇති කටාරම් සහිත ලෙන් විහාරය.

14. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩමාකඩවර අංක 25 බී ග්‍රාම නිලධාරි වසමට අයත් උඩමාකඩවර ග්‍රාමයේ පිහිටි උඩවත්ත විහාරය *හෙවත්* ශ්‍රී රේවත පිරිවෙන් භූමියේ ඇති කටාරම් සහිත ලෙන් විහාරය.

15. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩමාකඩවර අංක 25 බී ග්‍රාම නිලධාරි වසමට අයත් උඩමාකඩවර ග්‍රාමයේ පිහිටි උඩමාකඩවර ගොඩවීපැල නමින් හඳුන්වන ඉඩමේ ඇති පැරණි අම්බලම. (උතුරු අක්ෂාංශ 7 15' 17" N හා නැගෙනහිර දේශාංශ 80 x 28' 45" E).

**දකුණු පළාත**

16. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලිකුඩාව අංක 264 ග්‍රාම නිලධාරි වසමට අයත් පල්ලිකුඩාව ග්‍රාමයේ පිහිටි මාළිගාතැන්න නමින් හඳුන්වන භූමියේ ඇති පුරාවිද්‍යාත්මක සාධක සහිත ගොඩැල්ල. (උතුරු අක්ෂාංශ 06 x 01' 04.497" N හා නැගෙනහිර දේශාංශ 80 x 47' 13.994" E).

17. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවෙල අංක 195 ග්‍රාම නිලධාරි වසමට අයත කරගහවෙල ග්‍රාමයේ පිහිටි වෙහෙරගොඩැල්ල නමින් හඳුන්වන ඉඩමේ ඇති ස්තූප ගොඩැල්ල හා වෙනත් පෞරාණික ඉදිකිරීම් සාධක සහිත ස්ථානය. (උතුරු අක්ෂාංශ 6 x 12' 13.675" N හා නැගෙනහිර දේශාංශ 80 x 52' 39.337" E).

18. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නෙටොල්පිටිය - උතුර ග්‍රාම නිලධාරි වසමට අයත් නෙටොල්පිටිය ග්‍රාමයේ පිහිටි වෙහෙරගොඩැල්ල නමින් හඳුන්වන ඉඩමේ ඇති පැරණි ස්තූප ගොඩැල්ල. (උතුරු අක්ෂාංශ 06 x 04' 50.752" N හා නැගෙනහිර දේශාංශ 80 x 50' 55.209" E).

19. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොදරවාන දකුණ හා මොදරවාන උතුර ග්‍රාම නිලධාරි වසම්වලට අයත් මොදරවාන ග්‍රාමයේ පිහිටි සීලවතී පර්වත විහාර පරිශ්‍රයේ ඇති දොලොස් මහේ පහන් කණුව, ගිරිලිපිය හා ඒ වටා මීටර් 4කින් යුතු ප්‍රදේශය, පියගැට පෙළ සහ ඒ වටා මීටර් 6 කින් යුතු ප්‍රදේශය. (උතුරු අක්ෂාංශ 06 x 08' 23.7" N හා නැගෙනහිර දේශාංශ 80 x 42' 24.1" E).

20. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 450 බී, බඹරැන්ද උතුර ග්‍රාම නිලධාරි වසමට අයත් කුරුඹුරේ ග්‍රාමයේ පිහිටි පූර්වාරාම රජමහා විහාර පරිශ්‍රයේ ඇති සිතුවම් සහිත පැරණි ප්‍රතිමා ගෘහය.

21. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්ලල අංක 375 ග්‍රාම නිලධාරි වසමට අයත් හල්ලල ග්‍රාමයේ පිහිටි ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාර පරිශ්‍රයේ ඇති සිතුවම් සහිත පැරණි ප්‍රතිමා ගෘහය.

22. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙනිපිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් දෙනිපිටිය ග්‍රාමයේ, පොල්අතුමෝදර මාර්ගයේ, වරිපනම් අංක 216 ස්ථානයේ පිඹුරු අංක 1908 හි කැබලි අංක 01 ලෙස දක්වා ඇති බිම් කොටසට අදාළ මුල්ලෙගෙවත්ත නමැති ඉඩමේ ඇති පැරණි ප්‍රභූ නිවස හා එහි සිට උතුරු හා දකුණු දිශාවෙන් මීටර් 5ක් ද නැගෙනහිර දිශාවෙන් මීටර් 10ක් ද බටහිර දෙසින් ඇති මායිම් තාප්ප වශයෙන් වෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 5 x 58' 35.0" N හා නැගෙනහිර දේශාංශ 80 x 27' 25.2" E).

23. දකුණු පළාතේ, මාතර කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ විටියල උතුර ග්‍රාම නිලධාරි වසමට අයත් ඉහළ විටියල උතුර ග්‍රාමයේ පිහිටි සබරලේ ශ්‍රී නිවාසාරාම පුරාණ විහාර භූමියේ ඇති පොහොය ගෙය හා ඒ වටා සිව් දිශාවට මීටර් 5කින් යුතු භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6 x 03' 32.7" N හා නැගෙනහිර දේශාංශ 80 x 32' 37.2" E).

24. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටපොල දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් කොටපොල ග්‍රාමයේ පිහිටි ගැටබරු රජමහා විහාර පරිශ්‍රයේ ඇති කටාරම් සහිත ලෙන.

25. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැටපලකන්ද 273 සී ග්‍රාම නිලධාරි වසමට අයත් ඉහළ ගම්මැද්ද ග්‍රාමයේ පිහිටි මීමන ගල්කන්ද රජමහා විහාර පරිශ්‍රයේ ඇති කටාරම් සහිත ලෙන.

26. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 99 සී, මාගාල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් මාගාල්ල ග්‍රාමයේ කච්චිවත්ත පුරාණ විහාර භූමියේ පිහිටි ප්‍රතිමා ගෘහයේ ඇති පැරණි බිතුසිතුවම් හා මූර්ති සහ පැරණි චෛත්‍ය.

27. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උණවටුන බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් උණවටුන ග්‍රාමයේ ඇති උණවටුන පුරාණ ගණදෙවි කෝවිල් ගොඩනැගිල්ල, (උතුරු අක්ෂාංශ 6 x 01' 06" N හා නැගෙනහිර දේශාංශ 80 x 14' 88" E).

**මධ්‍යම පළාත**

28. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළල්පිටිය ග්‍රාම නිලධාරි වසමට අයත්, කළල්පිටිය ග්‍රාමයේ පිහිටි කළල්පිටිය පුරාණ විහාර භූමියට අයත් පැරණි ගෘහය සහ ධර්ම ශාලාවේ මධ්‍ය කොටස.

29. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටගල්ල ග්‍රාම නිලධාරි වසමට අයත්, හිප්පොල ග්‍රාමයේ පිහිටි වටගොඩ පුරාණ විහාර භූමියේ ඇති ප්‍රතිමා ගෘහය හා ධර්ම ශාලාව. (උතුරු අක්ෂාංශ 7 x 14' 55" N හා නැගෙනහිර දේශාංශ 80 x 41' 56" E).

30. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බූටාවත්ත දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත්, සාගම ග්‍රාමයේ පිහිටි සාගම රජමහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහ දෙක සහ සංඝාවාසය.

**බස්නාහිර පළාත**

31. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 789 ගුලවිට ග්‍රාම නිලධාරි වසමට අයත් ගුලවිට ග්‍රාමයේ පිහිටි හල්වල කැලෑවේ ඇති ප්‍රාග් ඓතිහාසික ගුහා අවාරණය හා එය පිහිටි ගල් පර්වත අන්තයේ සිට සිව් දිශාවට විහිදෙන මීටර් 100ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 16 x 25' 23.5" N හා නැගෙනහිර දේශාංශ 80 x 09' 37.9" E).

**ඌව පළාත**

32. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැටිගහතැන්න අංක 18 ග්‍රාම නිලධාරි වසමට අයත්, මැටිගහතැන්න ග්‍රාමයේ ශෛලභ්‍යාන්තරාරාම පුරාණ ලෙන් විහාර භූමියේ ඇති ශිලා ලේඛන සහිත කටාරම් ලෙන. (උතුරු අක්ෂාංශ 7 x 04' 38" N හා නැගෙනහිර දේශාංශ 81 x 09' 09" E).

33. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෝව අංක 69 - ඩී ග්‍රාම නිලධාරි වසමට අයත් දෝව ග්‍රාමයේ පිහිටි දෝව රජමහා විහාර භූමියේ ඇති ගල්තලාව මත නෙලන ලද ප්‍රතිමාව හා පැරණි දාගැබ. (උතුරු අක්ෂාංශ 6 x 51' 21.4" N හා නැගෙනහිර දේශාංශ 81 x 01' 19.7" E).

34. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝගොඩ අංක 76 ග්‍රාම නිලධාරි වසමට අයත් බෝගොඩ ග්‍රාමයේ පිහිටි බෝගොඩ රජමහා විහාර භූමියේ ඇති පැරණි දැව පාලම. (උතුරු අක්ෂාංශ 7 x 00' 29.7" N හා නැගෙනහිර දේශාංශ 80 x 59' 46.8" E).

35. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරවනාගම ග්‍රාම නිලධාරි වසමට අයත් අම්පිටිය ග්‍රාමයේ බෝගහවත්ත නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි පත්තිනි දේවාලය හා අනෙකුත් නටබුන්. (උතුරු අක්ෂාංශ 6 x 44' 09.88" N හා නැගෙනහිර දේශාංශ 80 x 56' 26.48" E).

36. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හපුතලේ ග්‍රාම නිලධාරි වසමට අයත් හපුතලේ ග්‍රාමයේ පිහිටි ශ්‍රී කතරගම දේවාල භූමියේ ඇති දේවාල ගෘහය, (උතුරු අක්ෂාංශ 6 x 45' 02.2" N හා නැගෙනහිර දේශාංශ 80 x 57' 28.7" E).

37. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගවරම්මාන ග්‍රාම නිලධාරි වසමට අයත් ගවරම්මාන ග්‍රාමයේ පිහිටි වීදුරුපොල ශ්‍රී පියතිස්ස පිරිවෙන් භූමියේ ඇති විල්සන් බංගලාව නමින් හඳුන්වන පැරණි ගොඩනැගිල්ල. (උතුරු අක්ෂාංශ 6 x 54' 01.66" N හා නැගෙනහිර දේශාංශ 80 x 51' 47.84" E).

EOG 09 - 0361/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.